ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2024.09.26

පැමිණිලි පාර්ශවය : අයි.ඩී. සුරේෂ් ලක්මාල් සෙනවිරත්න මයා
නො. 423/එච්/1,
රටියලාගොඩ,
අරුග්ගොඩ,
අළුබෝමුල්ල.

වගඋත්තර පාර්ශවය :

01. කා. උ.පො.ප. ජේ.එම්. ජානකී රසාදරී මිය
ළමා හා කාන්තා කාර්යාංශය,
පොලිස් ස්ථානය,
අළුබෝමුල්ල.

02. පො. ප. ටී.සී. අසංක රාජකරුණා මයා
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
අළුබෝමුල්ල.

03. පො.සැ. 41132 ජයන්ත ගුණසේකර මයා
ස්ථානාධිපති (විවිධ පැමිණිලි අංශය)
පොලිස් ස්ථානය,
අළුබෝමුල්ල.

04. උ.පො.ප. ඒ.එස්. චන්දන මයා
ස්ථානාධිපති (අපරාධ අංශය)
පොලිස් ස්ථානය,
අළුබෝමුල්ල.

<u>පැමිණිලි අංක: **4519/ 23 – 5206/23**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු 2023.11.15 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා 2023.11.10 වන දින ඉහත ලිපිනයේ සඳහන් නිවසේ සිටින

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අවස්ථාවේදී තමාගේ නිවසට ආසන්නයේ පිහිටි දීපා ලක්ෂ්මි යන අයගේ නිවසට ගල් ගැසූ බවට චෝදනා කරමින් රාත්‍රී 7.00 ට පමණ තමාගේ නිවස ඉදිරි පිටට පැමිණ එම කාන්තාව සහ ඇයගේ ස්වාමි පුරුෂයා විසින් බැණ වැදුණු බවත්, තමා එම චෝදනාව ප්‍රතික්ෂේප කළ ද දිගින් දිගටම බැන වැදුණු බැවින් එම අවස්ථාවේදීම අළුබෝමුල්ල පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් දැමූ බවත් පොලිස් ස්ථානයට යන විට රාත්‍රී 7.30 පමණ වූ බවත් ය. තමා නැවත නිවසට පැමිණෙන විට දීපා යන අයත් සුජිත්, දිලූ යන අය සහ ගමේ චණ්ඩි තිදෙනෙක් තමාගේ නිවස නිවස ඉදිරිපිට සිටි බවත් එම අවස්ථාවේදී සුජිත් යන අය තමාට පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. එසේ තමාට පහරදෙමින් දීපා ලක්ෂ්මි යන අයගේ නිවස ඉදිරි පිටට රැගෙන ගිය බවත් එම අවස්ථාවේදී තමාගේ බිරිඳ අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා වෙත රාත්‍රී 8.30ට පමණ දුරකථනයෙන් අමතා පහරදීම පිළිබඳව දැනුම්දුන් නමුත් පොලිසියේ නිලධාරීන් කිසිවෙක් නොපැමිණි බව සඳහන් කර ඇත. පසුව තමා නැවත නිවසට පැමිණි බවත් තමා නිවසේ සිටින විට රාත්‍රී 10.15 පමණ පොලිස් ජීප් රථය දීපා ලක්ෂ්මි යන අයගේ නිවස ඉදිරිපිට නතර කර වන්දන නිලධාරියා, කුමාර නිලධාරියා සහ රථය පැදවූ නිලධාරියා සහ තවත් නිලධාරියෙක් තමාගේ නිවස ඉදිරි පිටට පැමිණි බවත්, වන්දන නිලධාරියා තමාගේ ඔළුවට තුවක්කුව තබා "දැන් උබේ සෙල්ලම් ඉවරයි, දැන් යමං, ඔළුව කුඩුවෙන්න තියනවා" යනුවෙන් තර්ජනය කරමින් බැණ වැදුනු බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමා විසින් වන්දන නිලධාරියාගෙන් "ඇයි සර් මාව අරගෙන යන්නේ අපිටනෙ අනිත් අය ගැහුවෙ ඇයි එයාලව අරගෙන යන්නේ නැත්තේ" විමසූ බවත්, එවිට එම නිලධාරියා "ඒ අයවත් එකක් යනවා" යනුවෙන් ප්‍රකාශ කර, තමාට සහ තමාගේ නිවසේ කුලියට පදිංචිව සිටින මොහොමඩ් දිල්ෂාන් යන අයට ජීප් රථයට නගින ලෙස අණ කර ජීප් රථයේ නංවාගෙන පොලිස් ස්ථානයට රැගෙන ආ බවත් පොලිස් ස්ථානයට පැමිණෙන විට රාත්‍රී 10.30 පමණ වී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

පොලිස් ස්ථානයට රැගෙන පැමිණි පසු තමා සහ දිල්ෂාන් යන අය සිර මැදිරියට දැමූ බවත් කිසිදු පොතක සටහනක් නොලියූ බවත් කටඋත්තරයක් හෝ නොගත් බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී සිර මැදිරියේ තවත් සැකකරුවන් 04 ක් සිටි බව ප්‍රකාශ කර ඇත. 2023.11.11 දින උදෑසන 7.00 පමණ උපසේවක වැඩ භාරගත් කුමාර නිලධාරියා විසින් තමාගෙන් "මොකද වුනේ, කව්රු හරි ගැහුවද, නැහැ නේද, තැලුම් තුවාල තියනවා නම් කියන්න මම තමා දැන් ඔයාව භාර ගන්නේ" යනුවෙන් විමසූ බවත් එහිදී තමා විසින් "කවුරුත් ගැහුවේ නැහැ" යනුවෙන් ප්‍රකාශ කළ බවත් කුමාර නිලධාරියා යමක් සටහන් කරනු දුටු බවත් සඳහන් කර ඇත. පසුව තමාගේ බිරිඳ පෙ.ව. 7.15 පමණ කෑම රැගෙන පැමිණි බවත් එම අවස්ථාවේදී ස්ථානාධිපති පැමිණ මෙම සිදුවීමට අදාළ ගැහැණු පිරිමි සියලුමදෙනා අත්අඩංගුවට ගන්නා ලෙස වන්දන නිලධාරියාට ප්‍රකාශ කළ බවත්, වන්දන නිලධාරියා විසින් තමාගේ බිරිඳට සහ දිල්ශාන්ගේ බිරිඳට සිරමැදිරිය අසල පුටු දෙකක් සපයාදී වාඩිවන ලෙස ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. පසුව පෙ.ව. 9.15 පමණ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති ගුණරත්න මහතා පැමිණි බවත් තමා සිර මැදිරියේ සිටිනා දැක සිර මැදිරිය අසලටම පැමිණ "මොකද වුනේ සුරේෂ්" යනුවෙන් විමසූ බවත්, තමා විසින් "ඊයේ රණ්ඩුවක් උනා ඒකයි අපිව ගෙනාවේ" යනුවෙන් පැවසූ බවත් "දීපා ලක්ෂ්මි ඔයාට

විරුද්ධව දාපු පැමිණිල්ලට ඊයෙ නේද මම අවවාද කරලා යැව්වෙ" යනුවෙන් ප්‍රකාශ කර එම නිලධාරියා ගිය බවත් සඳහන් කර ඇත.

පසුව දහවල් 12.00 ත් 1.00 අතර කාලයේදී එස්.අයි. ජානකී නිලධාරිනිය තමා රඳවා සිටි සිරමැදිරිය ලගට පැමිණ උපසේවක නිලධාරියා වූ කුමාර මහතාට තමා එළියට ගන්නා ලෙස ප්‍රකාශ කළ බවත්, කුමාර නිලධාරියා විසින් සිරමැදිරියේ දොර අරිනවාත් සමගම එස්.අයි. ජානකී නිලධාරිනිය විසින් තමා ඇඳ සිටි ෂර්ට් එකෙන් ඇද, තමාගේ දකුණු කම්මුලට ඉතා තදින් පහරවල් කිහිපයක් ගැසූ බවත්, ඉන් පසු තමාගේ පිට ප්‍රදේශයට දිගටම පහර දෙමින් සුළු පැමිණිලි අංශය වෙත රැගෙන ගිය බවත් මෙම සිදුවීම තමාගේ බිරිඳ සහ එම ස්ථානයේ සිටි හර්ෂ නිලධාරියා, කුමාර නිලධාරියා සහ එම අවස්ථාවේ සිටි සියලුම පුද්ගලයින් දුටු බවත් ප්‍රකාශ කර ඇත. එසේ සුළු පැමිණිලි අංශය වෙත රැගෙන පැමිණි පසු ජානකී නිලධාරිනිය විසින් "දනගහපන් පරයා" යනුවෙන් බැණ වැදුනු බවත් තමා දණ ගැසූ පසු ජානකී නිලධාරිනිය විසින් "මටත් කලිසම ගලවල පෙන්නපන් බලන්න" යනුවෙන් ප්‍රකාශ කරමින් ඉතා අසභ්‍ය ලෙස බැණ වදිමින් තමාට අමානුෂික ලෙස පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමාගේ ඔළුවේ සිට මුළු ශරීරයටම පහරදුන් බවත්, ජානකී නිලධාරිනි සිය පාදයෙන් තමාගේ මුහුණට ගැසූ බවත් එම පහරට තමාගේ උඩු ඇන්දේ දතක් කැඩී ගිය බවත්, එම අවස්ථාවේදී විශාල ලේ ගැලීමක් සිදුවූ බවත් තමා බිම ඇද වැටුණු බවත් තමාට සිහිය නැති වූ බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සිදුවීම සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති ගුණරත්න නිලධාරියා, හර්ෂ නිලධාරියා, ජානකී නිලධාරිනිය, දීපා, අමිල, දිලූ යන අය එම ස්ථානයේ සිට බලා සිටි බවත්, තමාට සිහිය පැමිණෙන විට තමාගේ දකුණු කනෙන් ලේ පැමිණ තිබූ බවත්, තොල් පටවල් පුපුරා ලේ පැමිණ තිබූ බවත්, මුඛයෙන් ලේ විශාල ප්‍රමාණයක් පිට වූ බවත්, නළලේ දකුණු ඇසට උඩින් පහර වැදීම හේතුවෙන් ගෙඩියක් ඉදිමී ඇවිත් තිබූ බවත්, නාසයෙන් ද ලේ පැමිණ තිබූ බවත්, බඩට ගැසූ පහර හේතුවෙන් බඩ කොරවී තිබූ බවත් ප්‍රකාශ කර ඇත. මුත්‍රාශය ප්‍රදේශයට පහර දීම හේතුවෙන් මුත්‍රාෂය හිරවී අධික වේදනාවක් ගෙනදුන් බවත් තමාට සිහිය පැමිණි අවස්ථාවේදී ගුණරත්න නිලධාරියා තමා නැගිට්ටවා, තමාට ටැප් එක ලගට ගොස් මුහුණ සොදා ගන්නා ලෙස ප්‍රකාශ කළ බවත් තමාට පහර දෙන්නේ ඇයිදැයි විමසින් මුහුණ සොදගෙන පැමිණෙන විට තමාගේ කැඩුණු දත බිම වැටී තිබූ බැවින් එය එය අහුලා ගත් පසු හර්ෂ නිලධාරියා විසින් "ඕක විසි කරපන්" යනුවෙන් ප්‍රකාශ කර, එම ස්ථානයේ බිම ලේ විශාල ප්‍රමාණයක් වැටී තිබූ බැවින් රෙදි කැබලි දෙකක් ලබාදී බිම වැටී ඇති ලේ පිස දමන ලෙස ප්‍රකාශ කළ බවත්, තමා විසින් ඒවා පිස දැමූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව ගුණරත්න නිලධාරියා තමාව රැගෙන ගොස් සිරමැදිරියට දැමූ බවත්, එහිදී තමාට අමාරු බවත් රෝහලට රැගෙන යන ලෙසත් ප්‍රකාශ කළ නමුත් "ඕ.අයි.සී. මහත්තයා ආවට පස්සේ එයාට කියලා තමයි එක්ක යන්න වෙන්නේ" යනුවෙන් ප්‍රකාශ කළ බවත් තමා රෝහල් ගත කිරීමට කටයුතු නොකළ බවත් තමාට අමාරු බව කෑගසා කී නමුත් කිසිදු නිලධාරියෙක් තමා බැලීමට නොපැමිණි බවත් තමා කෑ ගසමින් සිටි බවත් ප්‍රකාශ කර ඇත.

2023.11.12 දින සවස 2.30 පමණ තමා උසාවියට ඉදිරිපත් කළ බවත්, නීතිඥවරිය හරහා තමාට පහරදුන් බව අධිකරණයට ප්‍රකාශ කළ බවත්, පසුව තමාට ඇප ලැබුණු බවත්, තමාට ඉතා අපහසු බැවින් කළුබෝවිල රෝහලට ඇතුළත් වී ප්‍රතිකාර ලබාගත් බවත් 2023.11.14 වන තෙක් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබාදෙමින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ පසුව තමාට සහ තම පවුලට දිගින් දිගටම අළුබෝමුල්ල පොලිස් ස්ථානයෙන් හිරිහැර සිදුවන බවත්, මේ හේතුවෙන් තම ජීවිතයට ජීවිත අවධානමක් පවතින බවත්, මෙම සිදුවීම් සම්බන්ධයෙන් පොලිස් සහන මැදිරිය, පානදුර ඒඑස්පී 1 කාර්යාලය, කළුතර ඒඑස්පී 1 කාර්යාලය පැමිණි කර ඇති නමුත් කිසිදු සහනයක් ලැබී නොමැති බවත්, අළුබෝමුල්ලේ පිහිටි තම නිවසට යාමට නොහැකිවී ඇති බවත්, තම දියණිය පාසල් යැවීමට නොහැකිවී ඇති බවත්, තමාට රැකියාවක් කර ගැනීමට නොහැකිවී ඇති බවත් ප්‍රකාශ කර ඇති අතර, තමාට සහ සිය පවුලට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව සානුකම්පිතව සලකා බලා සාධාරණයක් ඉටුකර දෙන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**පළමුවන වගඋත්තරකරු - කා. උ.පො.ප. ජේ.එම්. ජානකී රසාදරී මිය**

මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.05.09 දි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ 01 වන වගඋත්තර පාර්ශවය පහත කරුණු ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරුවන වන සුරේෂ් යන අයට සිදුවූ පහරදීමක් සම්බන්ධයෙන් 2023.11.10 දින (CIB II පිටුව:52 ඡේදය:77 යටතේ ) පැමිණිල්ලක් තිබූ බවත්, 2023.11.11 දින දීපා ලක්ෂ්මි යන අයට සුරේෂ් යන අය පුරුෂ ලිංගය පෙන්වූ බවට (CIB II පිටුව:56 ඡේදය:82 යටතේ) පැමිණිල්ලක් ගොනු කර ඇති බවත්, සුරේෂ් යන අය 2023.11.10 දින බැණ වැදීමක් සම්බන්ධයෙන් (CIB II පිටුව:52 ඡේදය:76 යටතේ) සුගත් හා දීපා යන අයට විරුද්ධව පැමිණිල්ලක් ගොනුකර ඇත. මෙම පැමිණිලි සම්බන්ධයෙන් වගඋත්තර කරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. 2023.11.11 දින අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප. චන්දන මහතා විසින් සුරේෂ් යන අය සහ දිල්ෂාන් යන අය ප.ව. 12.40 අයුතු ඇතුල්වීමක් සහ පහරදීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවත්, තමා මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී නොවූ බවත්, එම කාර්යය ස්ථානාධිපති විසින් උ.පො.ප. චන්දන නිලධාරියා වෙත පවරන ලද බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. සුරේෂ් යන අය සිරමැදිරියට දැමූ පසු තමා විසින් ඔහු සිරමැදිරියෙන් රැගෙන සුළු පැමිණිලි අංශයට ගෙන ගොස් ලිංගික අතවර කිරීමට අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමසුමක් සිදුකළ බවත්, එම ප්‍රශ්න කිරීම ප.ව. 12.30 – 1.00 කාලය තුළ සිදු කළ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකරු අදාළ චෝදනාව පිළිනොගත් බවත් ආවේගශීලීව හැසිරෙමින් ඔහුගේ අත් දෙකේ අල්ල බිත්තියේ ගසා ගත් බවත්, මුහුණ බිත්තියේ වද්දා ගත් බවත්, අතේ

අල්ල ප්‍රදේශය බිම පොළොවේද ගසාගත් බවත් මෙම සිදුවීම හේතුවෙන් පැමිණිලිකරුගේ තොල ප්‍රදේශයෙන් ලේ වහනය වන බව තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත.

පසුව පැමිණිලිකරු රෝහල වෙත රැගෙන යාමට උත්සාහ කළ ද එය ප්‍රතික්ෂේප කළ අතර, සුළු පැමිණිලි අංශයේ නිලධාරීන් දෙදෙනෙකුගේ සහය ඇතිව ලේ පිරිසිදු කළ බවත්, ලේ වහනය වීම නතර වූ පසු ප්‍රශ්න කිරීම නතර කර සිරමැදිරියට රැගෙන ගිය බවත් මේ පිළිබඳව (CIB II පිටුව:62/87 යටතේ) සටහනක් යොදා ස්ථානාධිපති දැනුවත් කළ බව ප්‍රකාශ කර ඇත. ලිංගික අතවරය සම්බන්ධ පැමිණිල්ලට අදාළව 2023.11.15 දින සාක්ෂි සටහන් කර, 2023.12.04 වන දින අධිකරණයට කරුණු වාර්තා කළ බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, 2023.11.11 දින පොලිස් ස්ථානයේදී සිදුවූ මෙම සිදුවීම සම්බන්ධයෙන්, එදින අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ රඳවා සිටි මහින්ද රම්‍යජීව යන සැකකරු 2023.11.16 දින පොලිස් ස්ථානයට ගෙන්වාගෙන සාක්ෂි ලෙස ප්‍රකාශයක් සටහන් කර ගත් බවත්, 2023.11.11 දින පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයට පැමිණිල්ලක් විභාග කර අවසන් කර ඊට අදාළව මුදල් ලබාදීමට පැමිණ සිටි ජානක තිලකරත්න යන පුද්ගලයා මෙම සිදුවීම දුටු නිසා 2023.11.13 දින නැවත පොලිසියට කැඳවා සාක්ෂි ලෙස ප්‍රකාශයක් සටහන් කරගත් බවයි. එසේ සාක්ෂි සටහන් කිරීමට හේතුව ලෙස වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් පොලිස් පහරදීමක් සිදු කළ බවට පැමිණිලි කළ බැවින් එම සිදුවීම දුටු පුද්ගලයින් දෙදෙනා සාක්ෂි ලෙස පසුව කැඳවා ප්‍රකාශ ලබාගත් බවයි.

ඉහත දක්වන ලද සාක්ෂි සටහන් කරගැනීම අදාළ සිදුවීම සිදුවී දින කිහිපයකට පසු සාක්ෂි සටහන් කර ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව නැවත වරක් ප්‍රශ්න කර සිටි අවස්ථාවේදී, පළමුවන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, "මෙහෙම සිද්ධියක් වුණා. ඒක නිසා අපිට විරුද්ධව මොනවා හරි කළොත් කියලා හිතලා ප්‍රකාශ සටහන් කර ගත්තා. ඊට අමතරව එතැන සිටි පොලිස් නිලධාරියෙකු වන පො.කො.36106 හර්ෂ මයාගෙන් ද ප්‍රකාශයක් සටහන් කළා" යනුවෙනි. තවද, මෙම සිදුවීමට තුඩුදුන් ලිංගික අතවරයට අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට තමා සහභාගී නොවූ බවත්, ලිංගික අතවරයට අදාළ පැමිණිල්ල ළමා හා කාන්තා කාර්යාංශයේ වෙනත් නිලධාරිනියක විසින් සටහන් ලබාගෙන ඇති අතර, තමා විසින් සිදුකරනු ලැබුවේ පැමිණිලිකරු 2023.11.11 දින චන්දන නිලධාරියා විසින් අත්අඩංගුවට ගත් පසු පැමිණිලිකරු සිර මැදිරියෙන් එළියට ගෙන ප්‍රශ්න කිරීම පමණක් බව ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - පො. ප. ටී.සී. අසංක රාජකරුණා මයා - ස්ථානාධිපති**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.07.11 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද අතර, ඒ සඳහා සහභාගී වූ 02 වන වගඋත්තර පාර්ශවය වන පො.ප. ටී.සී. අසංක රාජකරුණා (ස්ථානාධිපති - අළුබෝමුල්ල පොලිස් ස්ථානය) මයා විසින් පහත කරුණු ප්‍රකාශ කර ඇත. 2023.11.10 වන දින රාත්‍රී පැය 22.45 ට සුදත් අය අයට පහරදී තුවාල කිරීම සම්බන්ධයෙන් CIB II 52/77 යටතේ පැමිණිල්ලක් යොමුකර ඇති අතර, ඊට වගඋත්තරකරු වූ සුරේෂ් යන අය 2023.11.11 දින උ.පො.ප. චන්දන නිලධාරියා විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ප.ව. 12.40 පමණ ඉදිරිපත් කර ඇත. පසුව මෙම සැකකරු පානදුර ම/උ 13124 යටතේ 2023.11.12 දින අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, එහිදී සැකකරු අප මත මුදාහැර ඇත.

2023.11.10 දින පැමිණිලිකරු වන සුරේෂ් යන අය විසින් සුදත් සහ අශේන් යන පුද්ගලයින් තමාගේ නිවස අසලට පැමිණ බැන තර්ජනය කිරීම සම්බන්ධයෙන් CIB II 25/26 යටත් පැය 14.45 ට පැමිණිල්ලක් සිදුකර ඇත. එකී පැමිණිල්ලට වගඋත්තරකරු වූ සුදත් යන අය 2023.11.12 දින ප.ව. 12.30 ට පමණ පොලිස් ස්ථානයට කැඳවා ප්‍රකාශයක් සටහන්කර ගෙන ඇති අතර, එම පැමිණිල්ලට සුදත් යන අය අත්අඩංගුවට ගැනීමට වරදක් අනාවරණය නොවූ බැවින් පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමුකර ඇත. පැමිණිලිකරු වන සුරේෂ් යන අය විසින් ගොනුකරන ලද උක්ත පැමිණිල්ලට අදාළව සුදත් යන අයගෙන් (දීපා ලක්ෂ්මිගේ සැමියා) ප්‍රකාශයක් ලබාගන්නා අවස්ථාවේදී පැමිණිලිකරු වන සුරේෂ් යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර තිබුණි.

2023.11.11 දින පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමට පෙර පෙ.ව. 11.20 ට පමණ දීපා ලක්ෂ්මි යන අය විසින් පැමිණිලිකරු වන සුරේෂ් යන අයට විරුද්ධව ලිංගික අතවර කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් යොමු කර තිබූ අතර, එම සිදුවීම 2023.11.06 දින සිදුවූ සිද්ධියක් වන බැවින් පැමිණිල්ල සම්බන්ධයෙන් විශ්වාසනීයභාවයක් නොතිබූ බැවින්, 2024.11.12 දින පැමිණිලිකරු සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී, ලිංගික අතවර කිරීම සම්බන්ධ වරද සඳහන් නොකළ අතර පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට තුඩුදුන් CIB II 52/77 යටතේ යොමුකර තිබූ අයුතු ඇතුල් වීම හා පහරදීම යන පැමිණිල්ලට පමණක් 2023.11.12 දින අධිකරණයට ඉදිරිපත් කරන ලදි.

පැමිණිලිකරුට විරුද්ධව ගොනුකර තිබූ ලිංගික අතවරය සම්බන්ධ පැමිණිල්ල ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනිය විසින් විමර්ශනය කර 2023.11.15 දින දීපා ලක්ෂ්මි යන අයගේ දියණිය වූ කසුනි යන අයගේ සාක්ෂි සටහන් කරගෙන ඇත. මෙම වරදට සුරේෂ් යන අය නැවත අත්අඩංගුවට ගැනීමක් පොලිස් ස්ථානය විසින් සිදු නොකළ අතර, 2023.12.04 දින අධිකරණයට කරුණු වාර්තා කිරීමක් පමණක් සිදුකරන ලදි. මෙම වරද සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි අනාවරණය වීමක් සිදුවී නොමැති අතර නඩු කටයුතු තවම අවසන්වී නොමැත.

කොමිෂන් සභාව වෙත පැමිණිලිකරු විසින් යොමුකරන ලද පැමිණිල්ලට අදාළ සිදුවීම වූ 2023.11.11 දින සැකකරු අත්අඩංගුවට ගැනීමක් සිදුකර විමර්ශනය කිරීම සඳහා කා.උ.පො.ප. ජානකී නිලධාරිනියට උපදෙස් ලබාදී, පොලිස් ස්ථානයේ දෛනික රාජකාරී කටයුතු වල නිරත වෙමින් තමා සිය නිල කාමරයේ සිටි බවත්, ප.ව. 1.00 ට පමණ කා.උ.පො.ප. ජානකී නිලධාරිනිය විසින් සුරේෂ් යන අය විමර්ශන කටයුතු අතර තුර එකවරම ආවේගශීලීව හැසිරෙමින් මුහුණ බිත්තියේ ගසාගත් බවත් දැඩි පරිශ්‍රමයක් යොදා එය වළක්වා ගත් බවත් එම ස්ථානයේ පො.කො.36106 නිලධාරියා සහ පො.සැ.41132 නිලධාරියා සිට ඇති බවත් කා.උ.පො.ප. ජානකී නිලධාරිනිය විසින් තමාට ප්‍රකාශ කළ බව වගඋත්තරකරු කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත. සිරමැදිරියට පැමිණිලිකරු රැගෙන ආ පසු තමා සිරමැදිරිය අසලට ගොස් පැමිණිලිකරු සමඟ කතා කළ බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ යටි තොළ ඉදිමී තිබූ නමුත් ලේ වහනය වීමක් සිදු නොවූ බැවින් රෝහල් ගත වීමට අවශ්‍යද යන්න විමසූ බවත්, පැමිණිලිකරු ප්‍රතිකාර අවශ්‍ය නොවන තමාට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

ස්ථානාධිපතිගේ රාජකාරී කාමරය සුළු පැමිණිලි අංශයේ සිට මීටර් 30 පමණ දුරින් ප්‍රධාන ගොඩනැගිල්ලෙන් වෙන්ව වෙනම පිහිටා ඇති බැවින් එහි සිදුවන සිදුවීම් තමාට නොපෙනෙන බවත්, මෙකී සිදුවීම වූ දින කිසිදු ශබ්දයක් හෝ දර්ශනයක් නොදුටු බවත් වගඋත්තරකරු සඳහන් කර ඇත. මෙම සිදුවීම වූ අවස්ථාවේ තමා එම ස්ථානයේ නොසිටි බැවින් මෙම සිදුවීම ඇසින් දුටු පුද්ගලයින්ගෙන් කරුණු විමසීමක් සිදුකළ බවත්, එසේ කරුණු විමසීමක් සිදුකරනු ලැබුවේ 2023.11.12 දින රාත්‍රියේ කළුබෝවිල රෝහල වෙතින් පැමිණිලිකරුහට පොලිස් පහරදීමක් සිදු කළ බවට පැමිණිල්ලක් පවතින බවට දුරකථන පණිවිඩයක් ලැබුණු බැවින් බව ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම වන අවස්ථාවේදී තමා එම ස්ථානයේ නොසිටි බැවින් එම ස්ථානයේ සිටි හර්ෂ නිලධාරියා සඳහන් කළ පරිදි එම සිදුවීම දුටු පුද්ගලයින් දෙදෙනෙක් ගෙන්වා ප්‍රකාශ සටහන් කරගත් බව ප්‍රකාශ කර ඇත. තමා අළුබෝමුල්ල පොලිස් ස්ථානයට සේවයට පැමිණ ගත වූ වසර දෙකක කාලය තුළ පොලිස් පහරදීමක් සම්බන්ධයෙන් සැකකරුවෙකු අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් කිරීමක් සිදුකර නොතිබූ බවත් මෙවැනි සිදුවීමක් වූ පළමු අවස්ථාව වන බැවින් මෙකී සිදුවීම සම්බන්ධයෙන් තමා විසින් ඇසින් දුටුවායැයි සඳහන් ප්‍රකාශ සටහන් කරගත් බව සඳහන් කර ඇත. එහෙත් මෙම පැමිණිල්ල පොලිස් නිලධාරීන්ට විරුද්ධව සිදුකරන ලද්දක් වන බැවින් තවදුරටත් තමා විසින්ම විමර්ශනය කිරීම නොකළ යුතු යැයි තමාට හැඟී ගිය බැවින් සහ පැමිණිලිකරු ඒවන විටත් සහකාර පොලිස් අධිකාරීවරයා වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ බැවින් තමා විසින් තවදුරටත් මෙම සිදුවීම සම්බන්ධයෙන් සොයාබැලීමක් සිදු නොකළ බව ප්‍රකාශ කර ඇත.

තවද, පොලිස් ස්ථානයට ලැබෙන පැමිණිලි වලට අනුව ඒවා විමර්ශනය කර පොලිස් ස්ථානයෙන් අවවාද කළ හැකි පැමිණිලි වලට අවවාද කර දෙපාර්ශවය සමථයට පත්වන්නේ නම් පැමිණිලි විමර්ශනය අවසන් කරන අතර, එසේ නොමැති පැමිණිලි සමථ මණ්ඩලයට යොමුකරන අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම සිදුකළා හැර ඒකපාර්ශවීය භාවයෙන් කටයුතු කර නොමැති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**තුන්වන වගඋත්තරකරු - පො.සැ. 41132 ජයන්ත ගුණසේකර මයා - ස්ථානාධිපති (විවිධ පැමිණිලි අංශය)**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.05.09 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ 03 වන වගඋත්තර පාර්ශවය පහත කරුණු ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සිදුවූ දින එනම් 2023.11.11 වන දින තමා උදෑසන 6.47 ට පමණ රාජකාරිය සඳහා වාර්තාකර පැමිණිලි කිහිපයක් විභාග කරමින් සිටි බවත්, ඊට පෙර දින රාත්‍රියේ යම් කිසි සිදුවීමකට සුරේෂ් යන අය සහ ඩිල්ෂාන් යන අය අත්අඩංගුවට ගෙන පොලිස් සිර මැදිරියේ රඳවා සිටින බව තමා දුටු බවත්, තමා සුරේෂ් යන අය හඳුනාගත් බවත්, එසේ හඳුනාගනු ලැබුවේ “2023.11.10 දින දහවල් කාලයේ සුරේෂ් යන අයට විරුද්ධව තිබූ පැමිණිල්ලක් තමා විසින් විභාග කර දෙපාර්ශවයට අවවාද කර අවසන් කර තිබූ බැවිනි” යනුවෙන් ප්‍රකාශ කර ඇත. එසේ සුරේෂ් යන අයට විරුද්ධව තිබූ පැමිණිල්ල වූයේ, 2023.11.08 වන දින පැය. 8.50 ට CIB II 29/45 යටතේ දීපා ලක්ෂ්මි යන අය විසින් සුරේෂ් යන අය බීමත්ව සිය නිවස අසලට පැමිණ පරුෂ වචනයෙන් ඔවුන්ට බැන වැදීමක් කළ බවට සිදුකරන ලද පැමිණිල්ල වේ. එම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2024.11.10 දින පෙ.ව. 10.20 ට පමණ දෙපාර්ශවයම කැඳවා දෙපාර්ශවයටම අවවාද කළ බවත් ප්‍රකාශ කර ඇත. මෙකී සිදුවීම හේතුවෙන් තමා සුරේෂ් යන අය හඳුනාගෙන, ඔහු රඳවා සිටි සිර මැදිරිය අසලට ගොස් කථා කළ බවත්, එහිදී “සුරේෂ් මම ඊයේ පැමිණිල්ලක් විභාග කරලා දෙපැත්තටම අවවාද කරලා යැව්වා නේද, ඇයි ආයෙත් කූඩුවෙ ඉන්නේ” යනුවෙන් අසා ඔහු සමග කතා කොට සුළු පැමිණිලි අංශය වෙත ගිය බව ප්‍රකාශ කර ඇත. එදින ප.ව. 12.00 – 1.00 අතර කාලයේ තමා සුළු පැමිණිලි අංශයේ රාජකාරී කටයුතු කරමින් සිටි අවස්ථාවේදී කා.උ.පො.ප. ජානකී මිය විසින්, ලිංගික අතවර කිරීමක් පිළිබඳ පැමිණිල්ලක් සම්බන්ධයෙන් සුරේෂ් යන සැකකරු සිර මැදිරියෙන් රැගෙන තමාගේ අංශයට රැගෙන ආ බවත්, එසේ රැගෙන විත් සැකකරුගෙන් ප්‍රශ්නකරන විට එම සිද්ධියට තමාගේ සම්බන්ධයක් නොමැති බවට ප්‍රකාශ කරමින් ආවේගශීලීව හැසුරුණු බව ප්‍රකාශ කර ඇත.

ඉන් පසු සැකකරු සුළු පැමිණිලි අංශයේ බිත්තියට තුන් පාරක් පමණ සිය අල්ල ගසා ගත් බවත්, මුහුණ ද බිත්තියේ වදින සේ දෙපාරක් හෝ තුන්පාරක් ගසා ගත් බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී එම අංශයේ සිටි පො.කො. 36106 හර්ෂ නිලධාරියා සහ තමා සැකකරු ලගට ගොස් එම ක්‍රියාව වැළැක්වූ බවත්, ඔහුලේ උඩු තොලෙන් ලේ වහනය වනු දුටු බවත් ප්‍රකාශ කර ඇත. පසුව සැකකරු රෝහලට රැගෙන යාමට උත්සාහ කළ අය ප්‍රතික්ෂේප කළ බැවින් ස්ථානාධිපති දැනුවත් කර, ලේ වහනය වීම නතරවී තිබූ බැවින් නැවත සිර මැදිරියට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. වගඋත්තකරුගෙන් කොමිෂන් සභාව විසින් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී 2023.11.11 දින සිදුවූ සිදුවීමට අදාළව වෙනත් පාර්ශවයන්ගෙන් පසුව සාක්ෂි සටහන් කරගත් බවට ආරංචි වූ නමුත් එම පුද්ගලයන් කව්ද යන්න තමා නොදන්නා බව ප්‍රකාශ කරන ලදි.

**හතරවන වගඋත්තරකරු - උ.පො.ප. ඒ.එස්. චන්දන මයා - ස්ථානාධිපති (අපරාධ අංශය)**

මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.06.05 දි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද අතර ඒ සඳහා සහභාගී වූ 04 වන වගඋත්තර පාර්ශවය පහත කරුණු ප්‍රකාශ කර ඇත. තමා 2023.11.11 දින විශේෂ අපරාධ නිවාරණ මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටින අතරතුර, අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ එදින උපසේවා අංශයේ රාජකාරී කළ පො.කො. 100047 කුමාර නිලධාරියා විසින් පෙ.ව.9.30 පමණ දුරකථනයෙන් තමා අමතා පහරදීමක් සහ අයුතු ඇතුල්වීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී ඇති බවත්, අදාළ සැකකරුවන් දෙදෙනා නිවසේ සිටින බැවින් අත්අඩංගුවට ගන්නා ලෙස ස්ථානාධිපතිතුමා ප්‍රකාශ කළා යැයි තමාට කියූ බව ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමා සමඟ කා.උ.පො.ප. ජානකී මිය සහ පො.කො.36106 හර්ෂ, පො.කො. 100218 විජේරත්න, පො.කො. 103461 මදුරංග යන නිලධාරීන් සිටි බව සඳහන් කර ඇත. දුරකථන ඇමතුම පැමිණෙන විට පානදුර හොරණ මාර්ගයේ කුරුස හන්දියේ සිට ඇති අතර, අදාළ සැකකරුවන්ගේ නිවසට එම ස්ථානයේ සිට කි.මී. 02 පමණ දුරක් තිබී ඇත. විශේෂ අපරාධ නිවාරණ මෙහෙයුම් රාජකාරි සඳහා නිලධාරීන් පිරිස යතුරු පැදිවලින් පැමිණ තිබූ බැවින්, තමා පො.කො. 103461 මදුරංග නිලධාරියා සමග එක් යතුරු පැදියකින් ද, කා.උ.පො.ප. ජානකී මිය පො.කො.100218 විජේරත්න නිලධාරියා සමග ද, පො.කො. 36106 හර්ෂ නිලධාරියා තනිව යතුරු පැදියක ද අදාළ ස්ථානය බලා පිටත්ව ගිය බව සඳහන් කර ඇත. මෙම පිරිස සැකකරුගේ නිවසට යන විට පෙ.ව. 11.00 පමණ වූ බවත්, පැමිණිලිකාරියගේ නිවස සහ සැකකරුවන්ගේ නිවස එක ලඟ ආසන්නයේ පිහිටා තිබූ බවත්, පැමිණිලිකාරියගෙන් අදාළ පුද්ගලයින් කවුද යන්න විමසා තමා ප්‍රථමයෙන් සුරේෂ් යන අයගේ නිවසට නිලධාරීන් පිරිස සමග ගමන් කර වරද කියාදී පෙ.ව. 11.10 ට අත්අඩංගුවට ගත් බවත්, ඊට යාබද නිවසේ පදිංචිව සිටි ඩිල්ෂාන් යන අයට වරද කියාදී පෙ.ව. 11.15 ට අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. මෙම සැකකරුවන් අත්අඩංගුවට ගෙන පරික්ෂා කළ බවත්, බාහිරින් පෙනීමට කිසිදු තුවාලයක් නොතිබූ අතර, වටිනා කිසිවක් සන්තකයේ නොතිබූ බැවින්, එම අවස්ථාවේ එම ස්ථානයෙන් ගමන් කළ ත්‍රීරෝද රථයක් නවතා සැකකරුවන් දෙදෙනා සමග තමා එහි නැගී පොලිස් ස්ථානයට පැමිණි බවත් පොලිස් ස්ථානයට පැමිණෙන විට ප.ව. 12.30 පමණවී තිබූ බවත් සඳහන් කර ඇත. තමා විසින් සැකකරුවන් දෙදෙනා පැමිණීමේ සටහන් යොදා උපසේවක නිලධාරියාට භාරදී නැවත පොලිස් සංචාර රාජකාරී සඳහා ගිය බවත්, එහිදී කා.උ.පො.ප. ජානකී මිය නැවත තමා සමග නොපැමිණි බවත් ප්‍රකාශ කර ඇත. තවද, සැකකරුට පහරදීම සම්බන්ධයෙන් හෝ පසුව අදාළ සිදුවීම සම්බන්ධයෙන් සාක්ෂි සටහන් කර ගැනීමක් සම්බන්ධයෙන් හෝ තමා නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීම :**

01. පැමිණිලිකරු විසින් යොමුකරන ලද තොරතුරු අනුව කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් වාර්තාවක් කැඳවන ලදි. මෙම පහරදීම සම්බන්ධයෙන් 2023.12.12 දිනැතිව CA/CSTH/2023/126 දරණ යොමුඅංක යටතේ සුරේෂ් ලක්මාල් යන අය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි තමාට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් වෛද්‍යවරයා වෙත ප්‍රකාශ කර ඇති අතර, රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදෙනු ලබන රෝග ඉතිහාසයෙහි “2023.11.09 වන දින තමාගේ නිවස අසල පවුල් දෙකක් රණ්ඩුවක් ඇති වූ බවත්, එය පොලිසිය මාර්ගයෙන් සමාදන වූ බවත් සඳහන් කර ඇත. 2023.11.10 දින යාබද නිවසට කිසිවෙක් විසින් ගල් ගැසූ බවට එම නිවසේ පුද්ගලයින් තමාට චෝදනා කළ බැවින් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා නිවසට පැමිණි පසු නැවතත් එම පිරිස රාත්‍රී 10.00 පමණ පැමිණ රණ්ඩුවක් ඇතිවූ බැවින් සිය බිරිඳ 119 අමතූ බවත්, එහිදී පොලිස් නිලධාරීන් පැමිණ පැමිණිලිකාර තමා අත්අඩංගුවට ගෙන ගිය බවත් සඳහන් කර ඇත. රාත්‍රියේ පොලිස් ස්ථානයේ ගත කර ඇති අතර, 2023.11.11 දහවල් සිරමැදිරියේ සිටින විට කා.උ.පො.ප. ජානකී නිලධාරිනිය සිරමැදිරියෙන් ඉවතට ගෙන බැන වදිමින්, මුහුණට අතින් පහරදුන් බවත්, තමාට දණ ගසා ගන්නා ලෙස පැවසූ බවත්, දණ ගසා සිටින විට එම නිලධාරිනිය පයින් මුහුණට ගැසූ බවත්, ඒ අවස්ථාවේදී උඩු ඇන්දේ දතක් කැඩී ගොස් රුධිරණ වහනය වූ බවත්, දකුණු කනෙන් ද රුධිරය ගැලූ බවත්, පසුව තමාට සිහි නැති වූ අතර, එම ස්ථානයේ සිටි නිලධාරීන් තමාට වතුර ගැසූ පසු සිහිය පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. යටිබඩ ප්‍රදේශයට පයින් පහරදුන් බවත්, මුත්‍රා කිරීමට නොහැකිව තිබූ බවත්, බඩේ කැක්කුම සහ වමනේ යාම, කැරකිල්ල වැනි තත්ත්වයන් තිබූ බවත් 2023.11.12 දින උසාවියට ඉදිරිපත් කළ බවත්” ප්‍රකාශ කර ඇත.

02. අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි පහත සඳහන් කරුණු වාර්තා කර ඇත. “පැමිණිලිකරු වැඩිහිටි පිරිමි පුරුෂයෙක් වන අතර, තමාට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් කාලය, ස්ථානය, පුද්ගලයින් සම්බන්ධයෙන් දැනසිටි බවත්, වෛද්‍යවරයා සමග නිදහසේ කතා කළ බවත්” සඳහන් කර ඇත. වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කිරීමෙන් පසු පහත නිරීක්ෂණ ඉදිරිපත් කර තිබේ.

I. මුහුණේ දකුණු පැත්තේ 2 cm පමණ පිටතින් සහ 0.5cm පහළින් දකුණු ඇසට පිටින් ඇස ආසන්යේ 2 cm x 1 cm ප්‍රමාණයේ අවිධිමත් හැඩැති සීරිමක තුවාළයක් ඇත. (A 2cm x 1cm irregular shaped abrasion with dark colour scab formation was situated over the right side of the face 2cm outer and 0.5cm downwards from the outer margin of the right eye)

II. නාසයට 2cm පමණ උඩින් නාසය ආරම්භ ස්ථානය සහ මධ්‍ය රේඛාව අසල 0.5cm x 1.05cm පමණ ප්‍රමාණයේ සීරිමක ආකාරයේ තුවාළයක් ඇත. නාසයේ අස්ථි බිඳීමක් නැත. (A 0.5cm

x 0.5cm abrasion with dark colour scab formation was noted at the nose 2cm above from the base of the nose on the midline. There was no underline bone fracture.)

III. උඩු තොලේ 0.5cm පමණ ඇතුළට වන්නට 0.5cm පමණ ගැඹුරට 1cm x 0.5cm පමණ ප්‍රමාණයේ සීරීමක ආකාරයේ තුවාළයක් ඇත. (A 1cm x 0.5cm irregular shaped abrasion with dark brown scab formation was at the inner aspect of the upper lip 0.5cm inner side from the surface and 0.5 cm left from the midline)

IV. දන්ත විශේෂඥ උපදේශනයට අනුව, උඩු ඇන්දේ ඉදිරිපස දකුණු දත මුලින්ම කැඩී ගැලවී ගොස් ඇත. (According to the OMF referral there was a right central incisor fracture involving the crown root.)

V. දකුණු කකුලේ අතුළ් පැත්තේ 7cm මැදට වන්නට සහ දණහිසට 5cm පමණ පහලින් 1.5cm x 0.5cm ප්‍රමාණයේ තැළුම් පහරක් දැකගත හක. (1.5cm x 0.5cm irregular shaped blackish contusion at the inner side of the right leg 7cm from the midline and 5cm below from the middle of the knee joint.)

ඉහත දක්වන ලද තුවාල සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ මතය ලෙස, සියලුම තුවාල වල රටාව මොට බලයක් යෙදිය හැකි යමක් භාවිතයෙන් සිදුකරන ලද්දක් බවත් (All the injuries are compatible with that caused by blunt force trauma), අංක 1,2,3,5 යටතේ දක්වා ඇති තුවාල බලපතල තුවාල නොවන බවත් (Injuries number 1,2,3,5 are non-grievous), අංක 04 යටතේ දක්වා ඇති තුවාලය දණ්ඩ නීති සංග්‍රහයේ 311 g වගන්තිය ප්‍රකාරව බරපතල තුවාල ගණයට අයත් වන බවත් (The injury number 04 is a grievous injury under limp g section 311 of the penal code), පැමිණිලිකරුගේ සියළුම තුවාල, ඔහු විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය සහ දින සමඟ තුවාල රටාව ගැළපෙන බවත් (The dating and injury pattern is compatible with the given history of trauma) සඳහන් කර තිබේ. ඒ අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වන ලද නිරීක්ෂණ සහ මතය අනුව පැමිණිලිකරුට පහරදීමක් සිදුවී ඇති බවට සනාථ වේ.

03. පැමිණිලිකරුට 2023.11.11 දින 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් සිදුකරන ලද පහරදීම සනාථ කිරීම සඳහා 2023.11.30 දිනැතිව සුරේෂ් ලක්මාල් යන පැමිණිලිකරු විසින් සහ බිරිඳ වූ රසිකා දමයන්ති යන අය, ඥාති දියණියක් වූ දිනුෂා ස්වර්ණමාලි යන අය, ඥාති පුත්‍රයෙකු වූ මොහොමඩ් ඩිල්ෂාන් යන අය විසින් අඟුලාන, මොරටුව සාමදාන විනිශ්චකාර දිලිප් රොෂාන් කුමාර යන අයගේ අත්සනින් යුතුව දිව්රුම් ප්‍රකාශ 04 ක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. රසිකා දමයන්ති යන අය සහ දිනුෂා ස්වර්ණමාලි යන අය සිය දිව්රුම් ප්‍රකාශ මඟින් 01 වන

වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය පැමිණිලිකරුට අමානුෂික ලෙස පහරදෙන ආකාරය ඇසින් දුටු බවත්, මොහොමඩ් ඩිල්ෂාන් යන අය අයගේ දිව්රුම් ප්‍රකාශය මගින් තමා ද මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී සිරමැදිරියේ සිටි බවත් පැමිණිලිකරු වන තමාගේ මාමා ජානකී නිලධාරිනිය විසින් සිර මැදිරියෙන් පිටතට ගෙන සුළු පැමිණිලි අංශය වෙත යන තෙක් පහරදෙමින් රැගෙන ගිය බවත්, නැවත සිරමැදිරියට පැමිණෙන විට මාමාගේ දතක් ගැලවී, තුවාල ලබා අපහසුවෙන් සිටි බවත් සඳහන් කර ඇත. ඒ අනුව මෙකී දිව්රුම් ප්‍රකාශ මගින් පැමිණිලිකරු වෙත 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පහරදී ඇති බවට සනාථ වේ.

04. පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින්, තමා 2023.11.10 දින රාත්‍රී අත්අඩංගුවට ගෙන පැය 24 ට වඩා කාලයක් පොලිස් ස්ථානයේ රඳවා තබාගත් බවත් 2023.11.12 දින සවස 2.00 පමණ අධිකරණයට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර ඇත. මෙකී කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, 03 වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශය තුළ " 2023.11.11 දින තමා උදෑසන 6.47 ට පමණ රාජකාරිය සඳහා වාර්තාකර පැමිණිලි කිහිපයක් විභාග කරමින් සිටි බවත්, ඊට පෙර දින රාත්‍රියේ යම් කිසි සිදුවීමකට සුරේෂ් යන අය සහ ඩිල්ෂාන් යන අය අත්අඩංගුවට ගෙන පොලිස් සිර මැදිරියේ රඳවා සිටින බව තමා දුටු බවත්, තමා සුරේෂ් යන අය හඳුනාගත් බවත්, එසේ හඳුනාගනු ලැබුවේ, 2023.11.10 දින දහවල් කාලයේ සුරේෂ් යන අයට විරුද්ධව තිබූ පැමිණිල්ලක් තමා විසින් විභාග කර දෙපාර්ශවයට අවවාද කර අවසන් කර තිබූ බැවින් බවත්" යනුවෙන් ප්‍රකාශ කර ඇති අතර, එම නිලධාරියා විසින් සිර මැදිරිය අසලට ගොස් පැමිණිලිකරු සමග කතා කළ බව ද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගේ පැමිණිල්ලෙහි ද, "පෙ.ව. 9.15 පමණ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති ගුණසේකර මහතා පැමිණි බවත් තමා සිර මැදිරියේ සිටිනා දැක සිර මැදිරිය අසලටම පැමිණ "මොකද වුනේ සුරේෂ්" යනුවෙන් විමසූ බවත්, තමා විසින් "ඊයේ රණ්ඩුවක් උනා ඒකයි අපිව ගෙනාවේ" යනුවෙන් පැවසූ බවත් "දීපා ලක්ෂ්මි ඔයාටවිරුද්ධව දාපු පැමිණිල්ලට ඊයෙ නේද මම අවවාද කරලා යැව්වෙ" යනුවෙන් ප්‍රකාශ කර එම නිලධාරියා ගිය බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙකී සිදුවීම සනාථ කර ගැනීම සඳහා පො.සැ.41132 ජයන්ත ගුණසේකර නිලධාරියා 2023.11.11 දින රාජකාරියට වාර්තා කරන ලද පැමිණීමේ සටහන් කොමිෂන් සභාව වෙත ගෙන්වාගෙන පරික්ෂා කරන ලදි. එහිදී මෙම නිලධාරියා එදින පෙ.ව.6.47 ට රාජකාරියට වාර්තාකර ඇති බවට නිරීක්ෂණය විය. මෙම කරුණු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම 2023.11.10 දින රාත්‍රියේදී සිදුවී ඇති බව තහවුරු වේ.

05. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා 2023.11.11 දින කා.උ.පො.ප. ජානකී මිය සහ පො.කො.36106 හර්ෂ, පො.කො. 100218 විජේරත්න, පො.කො. 103461 මදුරංග යන නිලධාරීන් තමා සමඟ පිටත්ව ගිය බව 04 වන වගඋත්තරකරු වන උ.පො.ප. චන්දන නිලධාරියා කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත. නිලධාරීන්ගේ පැමිණීමේ පිටවීමේ ලේඛනයේද මෙම නිලධාරීන් එදින මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට භාරදී ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට භාරදී ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත. කරුණු එසේ තිබියදී, 01 වන වගඋත්තරුකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ, "අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප. චන්දන මහතා විසින් සුරේෂ් යන අය සහ දිල්ෂාන් යන අය ප.ව. 12.40 පමණ අයුතු ඇතුල්වීමක් සහ පහරදීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවත්, තමා මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී නොවූ බවත්, එම කාර්යය ස්ථානාධිපති විසින් උ.පො.ප. චන්දන නිලධාරියා වෙත පවරන ලද බවත්, තමා විසින් සිදු කලේ පැමිණිලිකරු සිරමැදිරියේ සිටි අවස්ථාවේදී ඉන් පිටතට ගෙන ප්‍රශ්න කිරීම පමණක් බවත්" ප්‍රකාශ කර ඇත. මෙකී පරස්පර විරෝධී කරුණු දැක්වීම අනුව, පැමිණිලිකරු 2023.11.11 දින අත්අඩංගුවට ගත් බවට සැකකරුවන්ගේ තොරතුරු ඇතුළත් නාමලේඛනයේ (DR Book) නම ඇතුළත් කර තිබුණ ද, 03 වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශය සහ ඉහත පරස්පර විරෝධී ප්‍රකාශ සලකා බැලීමේදී පැමිණිලිකරු 2023.11.10 දින අත්අඩංගුවට ගෙන 2023.11.11 දින සැකකරුවන්ගේ තොරතුරු ඇතුළත් නාමලේඛනයට (DR Book) නම ඇතුළත් කර ඇති බවට නිරීක්ෂණය වේ.

06. පැමිණිලිකරු සිය පැමිණිල්ල අවසානයේ, "මෙම පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ පසුව අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා විසින් තමාට සහ පවුලට දිගින් දිගටම හිරිහැර සිදුකරන බව" දක්වා ඇත. මෙකී ප්‍රකාශය පිළිබඳ අවධානය යොමු කිරීමේදී, පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාවේදී පැමිණිලිකරුට පක්ෂපාතීව මොහොමඩ් ඩිල්ෂාන් යන අය විසින් 01 වන වගඋත්තරුකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පැමිණිලිකරුට පහරදුන් බවට 2023.11.30 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකර ඇත. එහෙත් මොහොමඩ් ඩිල්ෂාන් යන අය විසින්ම 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදු නොකළ බවට දක්වමින් 2024.05.08 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇත. එම දිවුරුම් ප්‍රකාශය 2023.05.09 දින පවත්වන ලද පරීක්ෂණයේදී 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින්ම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. එම දිවුරුම් ප්‍රකාශය ලබාගෙන ඇත්තේ කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ල විභාගයට ගැනීමට පෙර දිනයේදී ය.

ඉහත සිදුවීම පිළිබඳව අවධානය යොමුකිරීමේදී එකම පුද්ගලයා විසින් අවස්ථා දෙකකදී දෙපාර්ශවය වෙත ප්‍රකාශ දෙකක් සඳහන් කර දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇති බවට නිරීක්ෂණය වේ. එහෙත් දිවුරුම් ප්‍රකාශවල දින වකවානු හා අනෙකුත් සාක්ෂි අනුව පළමු දිවුරුම් ප්‍රකාශය නිවැරදි ලෙස පිළිගැනීමට හේතු කාරණා ඇති අතර, දෙවන අවස්ථාවේදී ලබාදුන් දිවුරුම් ප්‍රකාශය යම් බලපෑමකට සිදුවී ඇති බවට නිරීක්ෂණය කළ හැක.

**නිරීක්ෂණ :**

01. පැමිණිලිකරු අළුබෝමුල්ල පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් ස්ථානයේ සිටියදී, 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පහරදුන් බවත්, මෙම පහරදීම හේතුවෙන් තමාට තුවාල සිදුවූ බවත් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එකී ප්‍රකාශයම පැමිණිලිකරු විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ද ලබාදී ඇති අතර, අධිකරණ වෛද්‍යවරයා විසින් පැමිණිලිකරුගේ සියළුම තුවාල, ඔහු විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය සහ දින සමඟ තුවාල රටාව ගැළපෙන බව සිය වෛද්‍ය වාර්තාව තුළින් ලබාදී ඇත. එමෙන්ම මෙකී පහරදීම සනාථ කිරීම සඳහා ලබාදී ඇති ඇසින්දුටු සාක්ෂි සහිත දිව්රුම් ප්‍රකාශ 02 තුළින් ද සනාථ කර තිබේ.

එහෙත් මෙම සිදුවීම පිළිබඳව 01 වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය හා 03 වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "සැකකරු සුළු පැමිණිලි අංශයේ බිත්තියට තුන් පාරක් පමණ සිය අල්ල ගසා ගත් බවත්, මුහුණ ද බිත්තියේ වදින සේ දෙපාරක් හෝ තුන්පාරක් ගසා ගත් බවයි." එහෙත් පැමිණිලිකරුට තුවාල සිදුවී තිබීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයා විසින් ලබාදී ඇති මතය සහ ඇසින් දුටු සාක්ෂි සහිත දිව්රුම් ප්‍රකාශ යන සාක්ෂි අනුව 01 වන හා 03 වන වගඋත්තරකරුවන් විසින් ලබාදී ඇති ප්‍රකාශයන් සත්‍ය ප්‍රකාශ බවට පිළිගත නොහැකි බව පෙනීයයි. ඒ අනුව 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පැමිණිලිකරුට පහරදී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

02. අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි දක්වා ඇති ආකාරයට මෙකී පහරදීම හේතුවෙන් පැමිණිලිකරුගේ උඩු ඇන්දේ ඉදිරිපස දකුණු දත මුලින්ම කැඩී ගැලවී ගොස් ඇති අතර, එම තුවාලය **දණ්ඩ නීති සංග්‍රහයේ 311 (g)** වගන්තිය ප්‍රකාරව බරපතල තුවාල ගණයට අයත් වන බව අධිකරණ වෛද්‍යවරයාගේ මතය **වේ. එනම් "අස්ථියක්, කාටිලේජ හෝ දතක් කැපීම හෝ භංග කිරීම හෝ අස්ථියක්, සන්ධියක් හෝ දතක් අවසන්ධි කිරීම"** යනුවෙන් දක්වා ඇත.

03. තවද, පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී "බාහිරින් පෙනීමට කිසිදු තුවාලයක් නොතිබූ බව" 04 වන වගඋත්තරකරු - උ.පො.ප. ඒ.එස්. චන්දන මයා - ස්ථානාධිපති (අපරාධ අංශය) විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇති අතර, එය පොලිස් ස්ථානයේ සුළු වැරදි තොරතුරු සටහන් පොතෙහි "පිටතින් පෙනෙන පරිදි තුවාල නැත" යනුවෙන් සටහන් කර ඇත. සැකකරු භාරගනු ලැබූ උපසේවක පො.කො. 10047 කුමාර නිලධාරියා විසින් ද "සුරේෂ් ලක්මාල් යන අය පරික්ෂා කර බලා භාර ගතිමි. උරහිසේ තැල්මක් දක්නට ඇත" යනුවෙන් පමණක් සටහන් යොදා ඇත. මෙකී ප්‍රකාශ හා සටහන් අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට පෙර සහ අත්අඩංගුවට ගෙන උපසේවක නිලධාරියා භාර ගන්නා අවස්ථාවේදී කිසිදු තුවාලයක් නොතිබූ බව පැහැදිලි වේ. ඒ අනුව පැමිණිලිකරුට අධිකරණ

වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති පරිදි බරපතල ලෙස තුවාල සිදුවී ඇත්තේ පොලිස් අත්අඩංගුවේ සිටියදී බව වැඩිදුරටත් තහවුරු වේ.

03. 01 සහ 03 වගඋත්තරකරුවන් විසින් මෙකී සිදුවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් සුළු පැමිණිලි අංශයේ බිත්තියට සිය අල්ල ගසා ගත් බවත්, මුහුණ ද බිත්තියේ වදින සේ ගසා ගත් බවයි. මෙම සිදුවීම වන අවස්ථාවේදී සුළු පැමිණිලි අංශයේ 01 සහ 03 වගඋත්තරකරුවන් ඇතුළුව නිලධාරීන් තිදෙනෙක් සිට ඇත. පොලිස් ස්ථානය තුළදී පොලිස් නිලධාරීන් තිදෙනෙක් ඉදිරිපිට පැමිණිලිකරු ආවේගශීලීව හැසුරුනේ නම් හෝ ආවේගශීලීව හැසිරීමට ඉඩ ඇති බවට හැඟී ගියේ නම් රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් තිදෙනාට සැකකරු පාලනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබූ බවද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

04. පැමිණිලිකරුගේ තොල ප්‍රදේශයෙන් ලේ වහනය වන බව තමා දුටු බවත්, සුළු පැමිණිලි අංශයේ නිලධාරීන් දෙදෙනෙකුගේ සහය ඇතිව ලේ පිරිසිදු කළ බවත්, ලේ වහනය වීම නතර වූ පසු ප්‍රශ්න කිරීම නතර කර සිරමැදිරියට රැගෙන ගිය බවත් මේ පිළිබඳව (CIB II පිටුව:62/87 යටතේ) සටහනක් යොදා ස්ථානාධිපති දැනුවත් කළ බවත් 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත. 03 වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියා විසින් ද, පැමිණිලිකරුගේ උඩු තොලෙන් ලේ වහනය වනු දුටු බවත් මෙම සිදුවීම පිළිබඳව ස්ථානාධිපති දැනුවත් කළ බවත්, ලේ වහනය වීම නතරවී තිබූ බැවින් නැවත සිර මැදිරියට රැගෙන ගිය බවත් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත.

මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන 02 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ, තමා සිරමැදිරිය අසලට ගොස් පැමිණිලිකරු සමග කතා කළ බවත්, පැමිණිලිකරුගේ යටි තොළ ඉදිමී තිබූ බවත් පමණි. ඒ අනුව පොලිස් ස්ථානයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කරන ස්ථානාධිපතිවරයා (02 වන වගඋත්තරකරු වන පො.ප. අසංක රාජකරුණා මයා) විසින් සිය නිලධාරීන් ලේඛනවල යොදන ලද සටහන් පරීක්ෂා කිරීමක් සිදුකර නොමැති බවත්, 01 වන හා 03 වන වගඋත්තරකරුවන් විසින් සිදුකරන ලද දැනුවත් කිරීම අනුව හෝ නිසිලෙස සිය අධීක්ෂණ වගකීම ඉටුකර නොමැති බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණ වේ.

05. 2023.11.11 දින අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයේ සිදුවූ මෙම සිදුවීම සම්බන්ධයෙන් ස්ථානයේ ස්ථානාධිපති විසින් එදින සිර මැදිරියේ රඳවා සිටි මහින්ද රම්‍යජීව යන සැකකරු 2023.11.16 දිනදී නැවත පොලිස් ස්ථානය වෙත ගෙන්වා ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. තවද සුළු පැමිණිලි අංශයට පෙර දිනකදී දමා තිබූ පැමිණිල්ලකට අදාළව මුදල් භාරදීමට 2023.11.11 දින පැමිණ තිබූ ජානක තිලකරත්න යන අය 2023.11.13 දිනදී නැවත පොලිස් ස්ථානයට කැඳවා එම අයගෙන් ද ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. එමෙන්ම මෙම පැමිණිල්ලේ 03 වන වගඋත්තරකරු වන

පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියාගෙන් සහ පො.කො. 36106 හර්ෂ නිලධාරියාගෙන් 2023.11.13 දිනදී ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව නිරීක්ෂණය වේ. මෙම ප්‍රකාශ සටහන්කර ගැනීමට හේතුව ලෙස ස්ථානාධිපති - අළුබෝමුල්ල කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ, 2023.11.12 දින රාත්‍රී කළුබෝවිල රෝහලෙන් දුරකථනය ඔස්සේ, මෙම පැමිණිලිකරුට පොලිස් පහරදීමක් සිදුවී ඇති බවට පණිවිඩයක් ලැබුණු බවත්, එම පණිවිඩය අනුව මෙම සිදුවීම සිදුවූ ස්ථානයේ තමා නොසිටි බැවින් එහි සිටි පො.කො. 36106 හර්ෂ නිලධාරියා සඳහන් කරන ලද පුද්ගලයින් ගෙන්වා ප්‍රකාශ සටහන් කරගත් බවත් පසුව තමා විසින්ම මේ පිළිබඳව විමර්ශනය කිරීම නුසුදුසු යැයි හැඟී ගිය බැවින් සහ ඒවන විටත් පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරීවරයා වෙත පැමිණිලිකරු තිබූ බැවින් තමා විසින් එම විමර්ශනය නතර කළ බවයි.

06. ස්ථානාධිපති - අළුබෝමුල්ල විසින් සිදුකරන ලද මෙකී විමර්ශනය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී, 2023.11.11 දින පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයේ සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් එදින සිරමැදිරියේ රඳවා සිටි සැකකරුවෙකු වන මහින්ද රම්‍යජීව යන අය පමණක් 2023.11.16 දිනදී නැවත ස්ථානයට කැඳවා ඇති නමුත් එදින සිරමැදිරියේ රඳවා සිටි අනෙක් සැකකරුවන් තිදෙනා පොලිස් ස්ථානයට කැඳවා ප්‍රකාශ සටහන් කිරීමට කටයුතු කර නොමැත. ඒ අනුව මෙම විමර්ශන කටයුත්ත කිසියම් සිදුවීමක් පොලිස් ස්ථානයේ සිදු නොවූ බව තහවුරු කිරීම උදෙසා ස්ථානාධිපති - අළුබෝමුල්ල විසින් කරන ලද්දක් බවට පෙනීයයි. තවද මෙම සිදුවීම සිදුවූ දින සුළු පැමිණිලි අංශයේ මිදුලේ සිටියා යැයි සඳහන් ජානක තිලකරත්න යන අය 2023.11.13 දින පොලිස් ස්ථානයට ගෙන්වා ප්‍රකාශයක් ලබාගැනීම තුළින් එය තවදුරටත් තහවුරු වේ. ඒ අනුව මෙම ක්‍රියාව අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කොමිෂන් සභාවට අසත්‍ය තොරතුරු සපයමින් කොමිෂන් සභාව නොමග යැවීමට ගන්නා ලද උත්සාහයක් බවට නිරීක්ෂණය වේ.

ඉහත දක්වන ලද සියලු නිරීක්ෂණයන් අනුව වගඋත්තර පාර්ශවය වන අළුබෝමුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ඇතැම් ප්‍රකාශයන් වල පරස්පරතාවයන් පවතින බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

**නිගමනය :**

2023.11.11 දින අළුබෝමුල්ල පොලිස් ස්ථානයේදී පැමිණිලිකරුට 01 වන වගඋත්තරකරු වන කා. උ.පො.ප. ජේ.එම්. ජානකී නිලධාරිනිය විසින් පහරදුන් බවත් එම පහරදීම හේතුවෙන් තම උඩු ඇන්දේ ඉදිරිපස දකුණු දත මුලින්ම කැඩී ගැලවී ගිය බවත්, මෙම පහරදීම හේතුවෙන් තමාට බොහෝ තුවාල සිදුවූ බවත් කොමිෂන් සභාව හමුවේ ගොනුකරන ලද පැමිණිල්ල, අධිකරණ වෛද්‍යවරයා විසින් පැමිණිලිකරුගේ සියළුම තුවාල, ඔහු විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය සහ දින සමඟ තුවාල රටාව ගැළපෙන බවට වෛද්‍ය වාර්තාවෙහි සඳහන් කර තිබීම සහ මෙකී පහරදීම සනාථ කිරීම සඳහා ලබාදී

ඇති ඇසින්දුටු සාක්ෂි සහිත දිවුරුම් ප්‍රකාශ යනාදී සියලු සාක්ෂි සැලකිල්ලට ගැනීමේදී මෙම පහරදීම 01 වන වගඋත්තරකරු විසින් විසින් සිදුකර ඇති බවට කොමිෂන් සභාව හමුවේ තහවුරුවී ඇත. ඒ අනුව **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෘර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම 01 වන වගඋත්තරකරුවන කා.උ.පො.ප. ජේ.එම්. ජානකී රසාදරී නිලධාරිනිය විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම පැමිණිලිකරු 2023.11.10 දින රාත්‍රී අත්අඩංගුවට ගෙන 2023.11.12 දින ප.ව.1.20 අධිකරණයට ඉදිරිපත් කරන තෙක් පොලිස් ස්ථානයේ පැය 24 ට වැඩි කාලයක් රඳවා තබාගත් බව ප්‍රකාශ කර ඇත. එකී ප්‍රකාශය 03 වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියා විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශයෙහි, " 2023.11.11 දින තමා උදෑසන 6.47 ට පමණ රාජකාරිය සඳහා වාර්තාකර පැමිණිලි කිහිපයක් විභාග කරමින් සිටි බවත්, ඊට පෙර දින රාත්‍රියේ යම් කිසි සිදුවීමකට සුරේෂ් යන අය සහ ඩිල්ෂාන් යන අය අත්අඩංගුවට ගෙන පොලිස් සිර මැදිරියේ රඳවා සිටින බව තමා දුටු බවත්, තමා සුරේෂ් යන අය හඳුනාගත් බවත් එසේ හඳුනාගනු ලැබුවේ, 2023.11.10 දින දහවල් කාලයේ සුරේෂ් යන අයට විරුද්ධව තිබූ පැමිණිල්ලක් තමා විසින් විභාග කර දෙපාර්ශවයට අවවාද කර අවසන් කර තිබූ බැවින් බවත්" සඳහන් කර තිබීම මඟින් පැමිණිලිකරු 2023.11.10 දින ප.ව. 10.15 පමණ අත්අඩංගුවට ගෙන 2023.11.12 දින ප.ව. 1.20 පමණ අධිකරණයට ඉදිරිපත් කරන තෙක් පොලිස් ස්ථානයෙහි පැය 39 ක් පමණ කාලයක් රඳවා තබාගෙන සිට ඇති බවට තහවුරු වේ.

**ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13 (2) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය." යන මූලික අයිතිවාසිකම 02 වන වගඋත්තර කරු වන පො.ප. අසංක රාජකරුණා (ස්ථානාධිපති - අළුබොමුල්ල පොලිස් ස්ථානය) විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

ඉහත නිගමන අනුව වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව, 13 (2) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

01. පළමු වගඋත්තරකරු වන කා.උ.පො.ප. ජානකී නිලධාරිනිය විසින් පැමිණිලිකරුට, දණ්ඩ නීති සංග්‍රහයේ 311 (g) ප්‍රකාරව බරපතල තුවාල කිරීමක් සිදුකර වධහිංසා පැමිණ වූ බවට තහවුරුවී ඇති බැවින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව පළමු වන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇත. ඒ අනුව පළමු වන වගඋත්තරකරු විසින් රු.100,000/- ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර පළමුවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

02. දෙවන වගඋත්තරකරු වන පො.ප. අසංක රාජකරුණා නිලධාරියා (ස්ථානාධිපති - අළුබොමුල්ල පොලිස් ස්ථානය) විසින් පැමිණිලිකරු වෙත රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර පළමුවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

<u>පොලිස්පතිවරයා විසින්,</u>

01. පළමු වගඋත්තරකරු වන කා.උ.පො.ප. ජානකී නිලධාරිනිය සම්බන්ධයෙන් මෙම ක්‍රියාවලියට අදාළව සුදුසු විනය පියවර ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

02. දෙවන වගඋත්තරකරු වන පො.ප. අසංක රාජකරුණා නිලධාරියා (ස්ථානාධිපති - අළුබොමුල්ල පොලිස් ස්ථානය) විසින් පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන් 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති අතර, 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීමට යටත් වේ. තවද, මෙකී සිදුවීම සම්බන්ධයෙන් සාක්ෂි නිර්මාණය කර මානව හිමිකම් කොමිෂන් සභාව නොමග යැවීමට උත්සාහගෙන ඇති බවට නිරීක්ෂණය වන බැවින් 02 වන වගඋත්තරකරු සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු වේ.

03. තවද, තුන්වන වගඋත්තරකරු වන පො.සැ. 41132 ජයන්ත ගුණසේකර නිලධාරියා සහ 04 වන වගඋත්තරකරු වන උ.පො.ප. ඒ.එස්. චන්දන නිලධාරියා විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ ලබාදීමේදී පරස්පර විරෝධී ප්‍රකාශ ලබාදීම සම්බන්ධයෙන් එම නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු වේ.

2024. 11. 14 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.
- ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.
- ඉහත නිර්දේශ ප්‍රකාරව පි.ගැ.

04. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
- අ.ක.ස.

05. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
එන්. එම්. පෙරේරා මාවත, කොටා රෝසය, කොළඹ 08.
- අ.ක.ස.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.